# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

**AAT/111/2024(PSC)**

ඩබ්..ඒ.ඒ.ඩී.යූ.ඉන්ද්‍රජිත්

**අභියාචක**

**එදිරිව**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

වගඋත්තරකරු

**දිනය :- 2025.05.29**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් රජයේ සේවක ඩී.ආර්.ඩී.යූ.දිසානායක මහතා.

වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් ශ්‍රීනාත් රූබසිංහ මහතා.

**විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා**

## -<u>නියෝගය</u>-

ඩබ්.ඒ.ඒ.ඩී.යූ.ඉන්ද්‍රජිත් නැමැති අය විසින්, 2024.05.27 දාතමින් යුක්තව මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයේ සඳහන් කර ඇත්තේ, ඔහු වෙත විනය දඬුවමක් වශයෙන් ලබා දී ඇති වැටුප් වර්ධක එකක් විලම්භනය කරමින් කර ඇති නියෝගය සම්බන්ධයෙන් ඔහු අතෘප්තියට පත්වී ඇති බැවින්, සාධාරණයක් ඉටුකර දෙන ලෙසට ය. අභියාචනා පෙත්සමේ සඳහන් සියළු කරුණු පරීක්ෂා කර බැලීමේ දී පෙනී යන්නේ, ඔහුගේ එකම ඉල්ලීම වන්නේ ඉහතින් සඳහන් වැටුප් වර්ධකයක් විලම්භනය කිරීමේ නියෝගය ඉවත් කර දෙන ලෙසයි.

එකී විනය නියෝගය පනවා ඇත්තේ, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් අභියාචකට ද පිටපතක් සහිතව වනජීවී හා වන සම්පත්

දෙපාර්තමේන්තුවේ ලේකම් වෙත යවන ලද 2024.04.29 දිනැති ලිපිය මගිනි. එම ලිපියේ සඳහන් කර ඇති පරිදි, ඉහත කී දඬුවම පනවා ඇත්තේ අභියාචක වෙත නිකුත් කරන ලද 2020.08.24 දිනැති චෝදනා පත්‍රය සම්බන්ධව පැවැති විධිමත් විනය පරීක්ෂණ වාර්තාව සහ අනිකුත් අදාළ කරුණු සළකා බැලීමෙන් අනතුරුව, අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා තුනට ඔහුව වැරදිකරු බවට තීරණය කිරීම හේතුවෙනි.

මෙහිදී සඳහන් කළ යුතු වන්නේ, එකී ලිපිය මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා තුනටම ඔහු වැරදිකරු කර ඇති නමුත්, විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියාගේ අවසාන තීරණය වී ඇත්තේ අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති පළමු චෝදනාව ඔප්පුකර නොමැති බවයි. විනය පරීක්ෂක විසින් අභියාචක වරදකරු කර ඇත්තේ දෙවන සහ තුන්වන චෝදනා වලට පමණි. ඒ අනුව පෙනී යන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විනය පරීක්ෂණයෙන් අනතුරුව අභියාචක එක් චෝදනාවකින් නිදහස් කර තිබියදී, රජ්‍ය සේවා කොමිෂන් සභාව එකී චෝදනාවට ද අභියාචක වැරදිකරු කර ඇති බවයි. එසේ කිරීමට හේතු දැක්වීම පරිපාලන නීතියේ අවශ්‍ය කරන වැදගත්ම කරුණක් වන නමුත්, එවැනි කිසිම හේතුවක් හෝ පැහැදිලි කිරීමක් විනය නියෝගයේ සඳහන් කර නොමැත. තවද මේ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ සඳහන් 22:6 සහ 22:7 දරණ වගන්ති වලටද මගේ අවධානය යොමු විය. එහිද සඳහන් වන්නේ විධිමත් විනය පරීක්ෂණයෙන් අනතුරුව දෙනු ලබන තීරණයකදී, චෝදනාලත් පුද්ගලයා නිවැරදිකරු බවට තීරණය වි තිබුණද, විනය බලධාරියා විසින් ඒ සම්බන්ධයෙන් වන කරුණු සළකා බලා දඬුවමක් පැනවීම සඳහා විනය බලධාරියාට අභිමතය ඇති බවයි. එසේ වුවත් එවැනි අභිමතයක් ක්‍රියාත්මක කිරීමේදි අදාළ තීරණයට එළඹීමට හේතුවූ කරුණු මොනවාද යන්න පැහැදිලිව සඳහන් කර තිබිය යුතු බව ඉහත 22:7 වගන්තියේ ද සඳහන් වේ. එබැවින් එම කරුණු සළකා බැලුවද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අභියාචක වෙත දඬුවම් පැමිණවීමට ගෙන ඇති තීරණය ඒ ආකාරයෙන් පවත්වා ගෙන යෑමට හැකියාවක් ලැබෙන්නේ නැත.

අභියාචක ඔහුට එරෙහිව තිබූ චෝදනා වලට වරදකරු කරමින් ලබා දී ඇති තීරණයේ නිරවද්‍යතාවය මීළඟට සළකා බලමි. ඒ සඳහා ප්‍රථමයෙන්ම පරීක්ෂා කර බැලිය යුතු වන්නේ ඔහුට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනා මොනවාද යන්නයි. එම චෝදනා පහත සඳහන් වේ.

**“01. ඔබ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළව ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා ඇති අංක බී/1883/17 දරණ නඩුවේ කටයුතු මෙහෙයවීම සඳහා, වනජීවී අධ්‍යක්ෂක ජනරාල්ගේ අනුමැතිය මත, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නීති ක්‍රියාත්මක කිරීමේ අංශයේ සහකාර අධ්‍යක්ෂ විසින් අංක වජී/11/01/05/99/II හා 2018.01.08 දිනැති ලිපියෙන් වනසත්ව අඩවි ආරක්ෂක එම්.ආර්.මොහොමඩ් මහතා වෙත නිසි පරිදි බලය පවරා තිබියදී හා/හෝ ඒ සම්බන්ධව ඔබ දැනුවත්ව සිටියදී, එම නඩුව 2018.01.19 දින විභාගය සඳහා කැඳවනු ලැබූ අවස්ථාවේ දී, වනජීවී අධ්‍යක්ෂක ජනරාල්ගේ නිසි අවසරයකින් තොරව අධිකරණය ඉදිරියේ කරුණු ඉදිරිපත් කිරීම මඟින් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමු උපලේඛනයේ 14 වන වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකිරීම.**

**02. ඔබ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළව ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා ඇති අංක බී/1883/17 දරණ නඩුව 2018.01.19 දින විභාගය සඳහා කැඳවනු ලැබූ අවස්ථාවේ දී, එම නඩුව මෙහෙයවීම සඳහා නිසි පරිදි බලය පවරනු ලැබූ වනසත්ව අඩවි ආරක්ෂක එම්.ආර්.මොහොමඩ් මහතාගේ රාජකාරි සඳහා බාධා කරමින්, වනජීවී අධ්‍යක්ෂක ජනරාල්ගේ නිසි අවසරයකින් තොරව අධිකරණය ඉදිරියේ කරුණු ඉදිරිපත් කිරීම මඟින් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමු උපලේඛනයේ 13 වන වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකිරීම.**

**03. ඔබ ඉහත I සහ II චෝදනාවන්හි සඳහන් වැරදි එකක් හෝ සියල්ලම හෝ සිදුකිරීමෙන් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමු උපලේඛනයේ 10 වන වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකිරීම.”**

වශයෙනි.

ඉහත චෝදනා සියල්ලම ඉදිරිපත් කිරීම සඳහා පාදක කර ගෙන ඇත්තේ ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා තිබූ අංක බී/1883/17 දරණ නඩුවේදී පැමිණිල්ල වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීම සඳහා, වනසත්ව අඩවි ආරක්ෂක එම්.ආර්. මොහොමඩ් මහතාට නිසි පරිදි බලය පවරා තිබිය දී, වනජීවී අධ්‍යක්ෂක ජනරාල්ගේ අවසරයකින් තොරව අභියාචක විසින්

අධිකරණය වෙත කරුණු ඉදිරිපත් කර තිබීමයි. ඒ මගින් ඉහත කී මොහොමඩ් යන අයගේ රාජකාරියට බාධා කළ බවට චෝදනා කර ඇත.

එම චෝදනාව සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව, ඒ සම්බන්ධයෙන් වන, 2024.01.04 දිනැති වාර්තාව ඩී.එච්.බී.එදිරිසිංහ නැමැති විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා විසින් ඉදිරිපත් කර ඇත. එකී වාර්තාවේ 4:1:1 ඡේදයේ සඳහන් කර ඇත්තේ, ප්‍රශ්නගත නඩු ගොනුව හා එහි මෙහෙයුම් කටයුතු සඳහා වනජීවී අධ්‍යක්ෂක ජනරාල් විසින් එම්.ආර්.මොහොමඩ් යන අයට බලය පවරා දී තිබූ බවයි. එම කරුණ විවාදයෙන් තොරව පිළිගෙන ඇති නමුත්, විමර්ශන නිලධාරියා එම ඡේදයේම සඳහන් කර ඇත්තේ, ඉහත කී මොහොමඩ් යන අයට ප්‍රශ්නගත නඩුව මෙහෙයවීම සඳහා වන බලය පැවරීමේ ලිපියේ පිටපතක් හෝ අභියාචක වෙතට හෝ වෙනත් අයෙකුට ලබාදී නොමැති බවයි. ඒ අනුව පැහැදිව පෙනී යන්නේ, මොහොමඩ් යන අයට නඩු කටයුතු පවත්වා ගෙන යාම සඳහා වූ අධ්‍යක්ෂක ජනරාල් විසින් කර ඇති බලය පැවරීම කිසිදු අවස්ථාවක අභියාචකගේ අනු දැනුමට ලක්වී නොමැති බවයි.

එවැනි තත්ත්වයක් යටතේ අභියාචක චේතනාත්මකව මොහොමඩ් යන අයට නඩු කටයුතු මෙහෙයවීම සඳහා බාධාකර තිබේ දැයි පැහැදිලිව තීරණය කිරීමට නොහැක. කිසියම් ක්‍රියාවකදී එම ක්‍රියාව කළ තැනැත්තාගේ චේතනාව කුමක් වී දැයි තීරණය කළ හැකි වන්නේ, ඒ හා සම්බන්ධ සිද්ධීන් සියල්ල සළකා බැලීමෙන් අනතුරුවය. ඉහත සඳහන් අන්දමට මොහොමඩ් යන අයට බලය පැවරීම අභියාචකගේ දැනුමට ලක්වී නොමැති නම්, අභියාචක හිතාමතාම මොහොමඩ් යන අයගේ රාජකාරියට බාධා කළාය යන කරුණ ඔප්පු කර ඇතැයි පැවසීම පිළිගත නොහැක.

මීළඟට සළකා බැලිය යුතු වන්නේ, නඩු කටයුතු මෙහෙයවීම සඳහා බලය පවරා ඇති මොහොමඩ් යන අයට බාධාවන අයුරින් අභියාචක කටයුතු කර තිබේද යන්නයි. විනය පරීක්ෂණයේ දී සාක්ෂි දී ඇති ප්‍රියන්ත සමන් එදිරිසිංහ යන අය පවසා ඇත්තේ, ප්‍රශ්නයට භාජනය වී ඇති සිද්ධිය වන අවස්ථාවේ දි ඔහුද එම නඩු කටයුතු වලට සහභාගී වූ බවයි. එහිදී මොහොමඩ් යන අය පැමිණිල්ල මෙහෙයවන නිලධාරී ලෙස කටයුතු කළ බවත්, ඔහුගේ සහාය සඳහා කසුන් සෝමසිරි, ඩී.ආර්.ප්‍රදීප් සහ අභියාචකද සහභාගී වූ බවයි. ඒ අවස්ථාවේ දි මොහොමඩ් යන අය පැමිණිල්ල මෙහෙයවමින් සිටි අතර, අභියාචක අධිකරණය වෙත දන්වා සිට ඇත්තේ, සිද්ධියට අදාළව කරන ලද

වැටලීමේ දී ගජමුතු **09**ක් අත් අඩංගුවට ගෙන ඇති බවත්, ඉන් අටක් පමණක් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බවත්ය.

එම ක්‍රියාව මගින් මොහොමඩ් යන අයගේ නඩුව මෙහෙයවීමේ කටයුතු වලට කුමන අන්දමින් බාධාවක් කර තිබේදැයි පැහැදිලි නැත. ඇත්ත වශයෙන් ම ඒ අවස්ථාවේ දී සිදුව ඇත්තේ, මොහොමඩ් විසින් ඉදිරිපත් කළ යුතු කරුණක් ඔහු විසින් ඉදිරිපත් නොකිරීම නිසා එම තත්ත්වය වටහාගත් අභියාචක විසින් අධිකරණය වෙත කරුණු දක්වා ඇති බවයි. ඒ බව සියලුම සාක්ෂි පරීක්ෂා කිරීමේ දී පෙනී යයි. අනික් අතට තර්ක කරන්නේ නම්, අභියාචක එම කරුණු ඉදිරිපත් නොකර තිබුණේ නම්, බරපතල අපරාධයකට අදාළ කරුණු වසන් කිරීමක් වීමටද තිබිණි.

ඉහත කී ප්‍රියන්ත සමන් එදිරිසිංහ යන අය සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, එම අවස්ථාවේ දී මහේස්ත්‍රාත්තුමා දෙදෙනාගෙන්ම ප්‍රශ්න කරමින් කටයුතු කළ බවයි. ඒ අනුව පෙනී යන්නේ අභියාචක විසින් මොහොමඩ් යන අයගේ කරුණු ඉදිරිපත් කිරීමට බාධා කිරීමට වඩා ඔහු විසින් කර ඇත්තේ, මහේස්ත්‍රාත්වරයාගේ ප්‍රශ්න වලට පිළිතුරු දීමක් කර ඇති බවකි.

ඩී.ආර්.ප්‍රදීප් යන අය සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ. මොහොමඩ් සහ අභියාචක යන අය එක ළඟින් පිහිටි ආසන දෙකක වාඩි වී සිටි බවත්, ඒ අවස්ථාවේ දී අභියාචක විසින් මොහොමඩ් යන අය වෙත නඩුවේ නඩු භාණ්ඩ අස්ථානගතවී ඇති බවට පැවසූ බවයි. එවිට මොහොමඩ් පවසා ඇත්තේ, එසේ කළහොත් එය උඩ බලාගෙන කෙළ ගහනවා වැනි වැඩක් නිසා, එහෙම කරන්න එපා කිව්ව බවත් ය. එම සිද්ධියෙන්ම පෙනී යන්නේ, අභියාචකගේ චේතනාව වන්නට ඇත්තේ මොහොමඩ්ට බාධා කිරීමට වඩා, අපරාධකරුවෙකු නීතියෙන් ගැලවීයාම වැළැක්වීමට ක්‍රියාකර තිබීමක් සිදුකර ඇති බවයි.

මේ අවස්ථාවේ දී අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් මොහොමඩ් යන අයට මෙම නඩුවට පමණක් සීමා කරමින් නඩුව මෙහෙයවීමට විශේෂ අවසරයක් ලබා දී ඇත්තේ කුමන පදනමක් යටතේ දැයි විමසා බැලිය යුතුය. එසේ කිරීම සඳහා විශේෂ හේතුවක් ඉදිරිපත් වී නැත.

ශාන්ත වීරසිංහ නැමැති සාක්ෂිකරු විධිමත් විනය පරීක්ෂණයේ දී සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ. ඔහු සහකාර අධ්‍යක්ෂක "**නීති ක්‍රියාත්මක කිරීම**" යන තනතුර හොබවමින් සිටි බවත්, අධිකරණ කටයුතු වල පැමිණිල්ල මෙහෙයවීම සඳහා පනතේ විධිවිධාන අනුවම, පළාත භාර සහකාර අධ්‍යක්ෂකවරයාට බලතල හා හැකියාව ඇති බවයි. අභියාචක එම තනතුරේ රාජකාරී කළ අයෙකි. එසේ නම් ඔහුට මෙම අවස්ථාවේ දි නඩු කටයුතු

මෙහෙයවීමට නීතියෙන්ම බලය ලැබී ඇති අතර, එම කාර්යයෙන් ඔහුව වැළැක්වීමට හැකියාවක් ද නැත. එසේ වැළැක්වීම නීතිය උල්ලංඝනය කිරීමක් ද වන්නට පුළුවන.

තවද ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව පෙනී යන්නේ, 2017.10.05 දින මිරිස්වත්ත ප්‍රදේශයේ දී සිදුකරන ලද වැටලීමකින් ගජමුතු 09 අත් අඩංගුවට ගෙන තිබුණත්, අධිකරණයට ඉදිරිපත් කර ඇත්තේ ගජමුතු 08ක් පමණක් බවයි. පැ.20 වශයෙන් විනය පරීක්ෂණයේ දී සළකුණු කරන ලද ලේඛනය, එනම් ඉහතකී සිද්ධියට අදාළ වැටලීම් වාර්තාව අනුව, නියාමක අතුකෝරල විසින් ප්‍රසාද් යන අය අත් අඩංගුවට ගන්නා විට ඔහු ලග ගජමුතු එකක්ද, නිසංසල යන අය ලග ගජමුතු එකක් ද, නියාමක ජයසිරි විසින් ගාමිණී යන අය අත් අඩංගුවට ගන්නා විට ඔහු සන්තකයේ ගජමුතු 07ක් ඇතුළු ගජමුතු 09ක් තිබුණ බවත් ය. නමුත් අධිකරණයට ඉදිරිපත් කර ඇත්තේ ගජමුතු 08ක් පමණක් වන නිසා, අභියාචක විසින් එම කරුණ අධිකරණයට නියමාකාරයෙන් වාර්තා කිරීමට උත්සාහ ගෙන ඇති බව පෙනී යයි. එම කරුණ ඔහු විසින් ඉදිරිපත් නොකළේ නම්, අපරාධයක් සම්බන්ධයෙන් වන පරීක්ෂණ සහ නඩු කටයුතු වලට ඉමහත් බාධාවක් වන්නට ද තිබුණි. එම කරුණ කෙරෙහි අවධානය යොමු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව උත්සාහයක් ගෙන නැත. ඇත්ත වශයෙන්ම, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය විය යුතුව තිබුණේ, මොහොමඩ් යන අයට මෙම නඩුව සම්බන්ධයෙන් නඩු කටයුතු පවත්වා ගෙන යාම සඳහා විශේෂ අවසරයක් ලබා දුන්නේ කුමන හේතුවක් නිසාදැයි සොයා බැලීමයි.

මෙහිදී සඳහන් කළ යුතු තවත් කරුණක් වන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අභියාචක විසින් කරන ලද පූර්ව සේවය සම්බන්ධයෙන් සළකා බැලීමක් කර නොතිබීමයි. අභියාචක මෙම අධිකාරය වෙත ලිඛිතව දන්වා ඇති පරිදි අලි පැටව් ජාවාරමක් වැළැක්වීම සඳහා එඩිතරව කටයුතු කළ බවට පුවත්පත් වාර්තා මගින් ද සනාථ වී තිබුණි. සිය රාජකාරී වගකීම් වලින් ඔබ්බට යමින්, අනේකවිධ කැපවීම් කළ විශිෂ්ඨයින් අගයනු පිණිස 2017.03.03 වෙනි දින ප්‍රදානය කරන ලද "**සේවා ප්‍රසාදිනී**" සහතිකයක්ද ඔහු වෙත ලබා දී ඇත. එය "X.3" වශයෙන් ඔහුගේ ලිඛිත දේශන සමග අමුණා ඇත. ඔහු වෙත අවංක රාජ්‍ය සේවකයන් තේරීමේ තරඟයකින් නිකුත් කර ඇති සහතිකය ද "X.4" වශයෙන් සළකුණු කර ඉදිරිපත් කර ඇත. 2024.03.24 දිනැතිව වනජීවි සංරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර ඇති "**ප්‍රසංශා**" සහතිකයක් ද ඔහු වෙත ලබාදී ඇත. රාජ්‍ය

සේවා කොමිෂන් සභාව විසින්, එම කරුණු කෙරෙහි සහ ඉහතින් සඳහන් කළ සිද්ධිය සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් අවධානය යොමු කර සළකා බලා, ඒ අනුව කටයුතු කර යුතුව තිබුණි.

කෙසේ වෙතත් ඉහතින් සඳහන් කළ කරුණු අනුව අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති ප්‍රථම චෝදනා දෙකට ඔහු වැරදිකරු කර තිබීම දෝෂ සහගතය. තුන්වන චෝදනාව ඉහත කී ප්‍රථම චෝදනා දෙක මත රඳා පවතී. ඒ අනුව මෙම විනිශ්චය අධිකාරයේ මතය වන්නේ, අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනා තුනෙන්ම ඔහු නිදහස් කළ යුතු බවයි.

එම කරුණු සළකා බලා අභියාචකට එරෙහිව ඔහුගේ වැටුප් වර්ධකයක් විලම්භනය කරමින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2024.04.29 දිනැති ලිපිය මගින් නිකුත් කර ඇති විනය නියෝගය අවලංගු කර අහෝසි කරමු. මෙම නියෝගය අනුව ඉදිරි කටයුතු කරන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවට දැනුම් දෙමු.

ඒ අනුව අභියාචකගේ ඉල්ලීමට අවසර දෙමු.

අභියාචනයට අවසර දෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

(ජේ.ජේ.රත්නසිරි)
(සාමාජික)

මම එකඟ වෙමි

(එස්.නන්දසේකරන්)
(සාමාජික)

ලලිතා/-